ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන, සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ

**3.** සංස්ථාපිත මණ්ඩලය සංස්ථාපනය කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) පිළිකා රෝගීන් හා මරණ සංඛ්‍යාව අඩු කිරීම සහ පිළිකා රෝගය වළක්වා ගැනීම, රෝගය කල් ඇතිව හඳුනා ගැනීම, රෝග විනිශ්චය හා සහන සත්කාර මඟින් පිළිකා රෝගීන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම;

(ආ) සෑම පිළිකාවකින්ම 30-50% ක් පමණ වන පිළිකාවන් වළක්වා ගත හැකි තත්ත්වයේ පවතින බැවින් පිළිකා වැළැක්වීම උදෙසා අඩු වියදම් හා දීර්ඝ කාලීන උපායමාර්ග ආරම්භ කිරීම;

(ඇ) සාර්ථක ප්‍රතිකාර අවස්ථාවන් වැඩිකර ගැනීම සඳහා රෝග ලක්ෂණ පෙන්නුම් කරන රෝගීන් හැකිතාක් කලින් හඳුනා ගැනීමට කටයුතු කිරීම;

(ඈ) පිළිකා රෝගීන්ට සුව වීම හෝ සැලකිය යුතු ලෙස දීර්ඝ කාලයක් ජීවත් වීම සඳහා උපකාර කිරීම සහ පිළිකා රෝගයෙන් සුවපත් වූවන්ට හැකි උපරිම ගුණාත්මක ජීවන මට්ටමක් සහතික කිරීම;

(ඉ) මූලික සෞඛ්‍ය සේවා සහ ප්‍රජා/නිවාස මූලික රැකවරණය පිළිබඳව අවධාරණය කරමින් සහන සත්කාර සඳහා ඇති ප්‍රවේශය වැඩි දියුණු කිරීම; සහ

(ඊ) පිළිකා රෝගයෙන් වේදනා විඳින්නන් හා ඔවුන්ගේ පවුල්වල අයගේ මානසික, සාමාජීය සහ පොදුවේ ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමට සහාය වීම.

